# 177 නෙතට නොපෙනී

නෙතට නොපෙනී මිනිසි මාගේ
සැඟවී ඉන්නේ දෙව්ඳුනේ
හරිම ආසයි ඔබ දකින්නට
මගේ මැසසින් දෙව්ඳුනේ
සාදා ආදරයේ ///

කියන්නට මට බොහෝ දේවල්
හිතෙනවා දෙව් සමිඳුනේ
හදේ ගිනිදැල් සුසුම් කඳුලැලි
ඔබ දනී මගේ දෙව්ඳුනේ
සදා ආදරයේ ///

මගේ සුහද වූ මිතුරු මිතුරියෝ
වැටී දෙදණින් දැන් යදී
පිහිට ඔබගේ සුහද දෝතින්
දෙන්න සමිදේ මේ දිනේ
සදා ආදරයේ ///
බලා සමිඳුනි හෙළ පුතුන් ඔබ
ගෙවන ජීවය මේ දිනේ
අඬන අම්මට තැවෙන පිය හට
දෙන්නැ සහනය සමිඳුනේ
සදා ආදරයේ///

මගේ පවුලේ සැම දෙනාටම
පිහිට වෙන්න'ප සමිඳුනි
ඔබට දහසක් පින් කියන්නෝ
ඔබමැ දරුවෝ මේ දිනේ
සුහද සමිඳාණෝ ///
ආදරේ කිරි සාගරේ ලොව
ඔබයි මගේ එක දෙව්සුරෝ
ඔබට පින් දෙමි වැටී වඳිනෙමි
දකින තෙක් ඔබ මගෙ නෙතින්
සුහද සමිඳානෝ